
**<u>සිතියම් අංක 08 : කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජලවහනය</u>**

කොට්ඨාසයේ භූ විෂමතාවයට අනුරූපීව ජල වහන රටාව නිර්මාණය වී ඇති අතර කොට්ඨාසය පුරා පැතිරී ඇති ක්ෂුද්‍ර ජල පෝෂක බොහොමයක් එක්ව කුරු ගංගා ද්‍රෝනිය නිර්මාණය වී ඇති අතර, කුරු ගඟ කොට්ඨාසයේ ඊසාන මායිමේ සිට නිරිතදිග මායිම දක්වා ගලා ගොස් කොට්ඨාසයේ සීමාව ද පසු කරමින් කුරුගංමෝදරදී කළු ගඟට එක් වෙයි. කළු ගඟේ ප්‍රධාන අතු ගංගාවක් ලෙසින් ද කුරු ගඟ හඳුනාගෙන ඇත. ඒ අනුව කොට්ඨාසයේ ජල අවශ්‍යතාවය සපුරාලන ප්‍රධානතම ජල මූලාශ්‍රය වශයෙන් කුරු ගඟ පෙන්වා දිය හැකිය. පහත සිතියම් අංක 08 මගින් කොට්ඨාසයේ කුරු ගං ද්‍රෝනිය පෝෂණය වන ජල වහන රටාව නිර්මාණය වී ඇති අයුරු පෙන්වා දී ඇත.

සිතියම් අංක 08: **කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ** ජල වහනය



## සිතියම් අංක 09: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාෂාණ ව්‍යාප්තිය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ භූ විද්‍යා සිතියමට අනුව කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පාෂාණ ව්‍යාප්තිය පහත සිතියම් අංක 09 මගින් පෙන්වා දී ඇත.


එම සිතියමෙහි දත්තයන්ට අනුව මෙම කොට්ඨාසය ප්‍රාග් කේම්බ්‍රිය යුගයකට අයත් උස්බිම් ශ්‍රේණියට අයත් වූ පාෂාණ වලින් සෑදි ඇති බව දක්නට ලැබේ. එහි ක්වාට්සයිට් පාෂාණය ප්‍රමුඛ ව්‍යාප්තියක් පෙන්වන අතර එය ආසන්න වශයෙන් හෙක්ටයාර 10,792.60 ක හෙවත් 57% ක ව්‍යාප්තියක් පෙන්වයි. නැගෙනහිර සීමාව තුළ ප්‍රධාන වශයෙනුත්, ඊට අමතරව උතුරු දකුණු දිශානුගතවත් ක්වාට්සයිට් පාෂාණය ව්‍යාප්ත වී ඇත. චානොකයිට් හා චානොකයිට් නයිස් පාෂාණය බටහිර සීමාව තුළ ප්‍රමුඛ වී ඇති අතර, උතුරු දකුණු දිශානුගතව ද, යම් ව්‍යාප්තියක් පෙන්වයි. ප්‍රමාණාත්මකව සැලකූ විට මෙය ආසන්න වශයෙන් හෙක්ටයාර 7936.89 හෙවත් 42% ක ප්‍රතිශතයකි. මීට අමතරව මාබල් පාෂාණය සුළු වශයෙනුත්, විභේදනය නොවූ උස්බිම් පාෂාණ ඉතා සුළු වශයෙනුත් උතුරු සීමාව ඔස්සේ ව්‍යාප්තව ඇති අයුරු සිතියම් දත්ත අනුව පෙන්වා දිය හැකිය.

මෙම සියළු දත්ත පහත වගු අංක 04 මගිනුත්, ප්‍රස්ථාර අංක 01 මගිනුත් පෙන්වා දී ඇත.


**වගු අංක 04: කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පාෂාණ ව්‍යාප්ති දත්ත**

| | පාෂාණ වර්ගය | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 01 | ක්වාටර්සයිට් | 10792.60 | 57 |
| 02 | චානොකයිට් හා චානොකයිට් නයිස් (Charnockite & Charnockite genies) | 7936.89 | 42 |
| 03 | මාබල් පාෂාණ (Marble ) | 182.05 | 1 |
| 04 | විභේදනය නොවූ උස්බිම් පාෂාණ (Undifferendicated Highland Series) | 128.17 | 0 |

**ප්‍රස්ථාර අංක 01: කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පාෂාණ ව්‍යාප්ති දත්ත**



සිතියම් අංක 09: කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පාෂාණ ව්‍යාප්තිය



## සිතියම් අංක 10 : කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෑවුම් කලාප ව්‍යාප්තිය


මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 1:10,000 පරිමාණ සමෝච්ඡ රේඛා සිතියම පාදක කර ගනිමින් සකසන ලද භූ විෂමතා සිතියම ඇසුරින් බෑවුම් කලාප සිතියම නිර්මාණය කර ඇත. ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ප්‍රධාන බෑවුම් කලාප 06 ක් හඳුනා ගත හැකිය. දැනට වර්ගීකරණයට ලක්වී ඇති සෑම බෑවුම් කලාපයක්ම මෙම කොට්ඨාසයේ ඇති හෙයින් භූමි පරිහරණ යෝග්‍යතා දර්ශක සිතියම සැකසීමේදී එය වැදගත් වෙයි. පහත සිතියම් අංක 10 මගින් කොට්ඨාසයේ බෑවුම් කලාපයන් පෙන්වා දී ඇති අතර ඒ අනුව උතුරු හා නැගෙනහිර දිශානුගතව වැඩි බෑවුම් ප්‍රදේශත්, බටහිර හා දකුණු දිශානුගතව බෑවුම අඩු ප්‍රදේශත් නිරීක්ෂණය වනු ඇත. එමෙන්ම කොට්ඨාසයේ 80% ක්ම 0% - 30% ත් අතර බෑවුම් පරාසයක වන බවද සිතියම් තොරතුරු වලින් නිරීක්ෂනය වෙයි.

සිතියමට අනුව කොට්ඨාසයේ භූමි ප්‍රමාණය බෑවුම් කලාප වලට බෙදී ගිය ආකාරය පහත වගුව හා ප්‍රස්ථාරය මගින්ද නිරූපිතය.

**වගු අංක 05: කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ බෑවුම් කලාප දත්ත**

| අනු අංකය | බෑවුම් කලාපය | වර්ග ප්‍රමාණය (හෙක්.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| **1** | 0% - 8% | 6805.14 | 40% |
| **2** | 8% - 16% | 2989.47 | 17% |
| **3** | 16% - 30% | 4029.27 | 23% |
| **4** | 30% - 45% | 2270.49 | 13% |
| **5** | 45% - 60% | 864.01 | 5% |
| **6** | 60% ට වැඩි | 364.72 | 2% |

**ප්‍රස්ථාර අංක 02:** **කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෑවුම් කලාප දත්ත**



**සිතියම් අංක 10:** කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ බෑවුම් කලාප ව්‍යාප්තිය

